මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :LAE/2025/96

2025.05.05

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් - 2025 මැයි 06

## මැතිවරණ ප්‍රතිඵල විකාශන අයිතිය ලබා දීම

**01.** <u>නිල මැතිවරණ ප්‍රතිඵල නිකුත් කිරීම</u>

2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී සහතික කරන ලද නිල මැතිවරණ ප්‍රතිඵල විකාශනය කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ අවසරය ලබා ගත යුතු වේ. අදාළ ගෙවීම් සිදුකර ලියාපදිංචි වන විද්‍යුත් මාධ්‍ය ආයතන සඳහා පමණක් සහතික කරනු ලබන ප්‍රතිඵල, ආරක්ෂිත පරිගණක ජාලයක් මඟින් එසැනින් ලබා දීමට අවශ්‍ය කටයුතු මැතිවරණ කොමිෂන් සභාව විසින් සම්පාදනය කර ඇත.මේ වනවිටත් මැතිවරණ ප්‍රතිඵල විකාශන අයිතිය ලබා ගෙන ඇති මාධ්‍ය ආයතනවල ලැයිස්තුවක් මේ සමඟ අමුණා ඇත.මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ද සඳහන් කොට ඇත.

**02.** <u>නිල නොලත් මැතිවරණ ප්‍රතිඵල ( **Unofficial Election Results**) විකාශනය</u>

පසුගිය මැතිවරණ වලදී සමහර මාධ්‍ය ආයතන වල ප්‍රාදේශීය නියෝජිතයින් විසින් නිල නොවන ලෙස ලබා ගන්නා ලද ප්‍රතිඵල විකාශනය කිරීමෙන් මැතිවරණ ප්‍රතිඵල කෙරෙහි ඇති මහජන විශ්වාසය බිඳ වැටුණු බව දක්නට ලැබුණි. එබැවින් සියළුම විද්‍යුත් මාධ්‍ය (රූපවාහිනී, චන්ද්‍රිකා රූපවාහිනී, ගුවන් විදුලි, අන්තර්ජාල පුවත්පත්, වෙනත් වෙබ් අඩවි, මුහුණුපොත (Facebook), YouTube,ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා සහ වෙනත් සමාජ මාධ්‍ය ජාල විසින් නිල නොවන ප්‍රතිඵල විකාශනය කිරීමෙන් සම්පූර්ණයෙන් වැලකී සිටින ලෙස අවධාරණය කරනු ලැබේ.

**03.** <u>ප්‍රතිඵල විකාශන අයිතිය සඳහා ලියාපදිංචි නොවූ විද්‍යුත් මාධ්‍ය</u>

මැතිවරණ ප්‍රතිඵල විකාශන අයිතිය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ විධිමත් ලෙස ලියාපදිංචි නොවන සියළුම විද්‍යුත් මාධ්‍ය ආයතන විසින් ප්‍රතිඵල එසැනින් ප්‍රචාරය කිරීමෙන් වැලකී සිටිය යුතු වේ.

<u>සැලකිය යුතුයි</u>

එසේ වුවද එවැනි මාධ්‍ය ආයතන සඳහා සහනයක් වශයෙන් ඡන්ද විමසීමේදී පළාත් පාලන ආයතන 339 හි ඒ ඒ දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව සහ මන්ත්‍රී ධූර සංඛ්‍යාව සහිත පළාත් පාලන ආයතන අවසන් ප්‍රතිඵලය, යනාදිය විකාශනය කිරීමට ඔවුන්ට බාධාවක් නොමැති අතර <u>පැයෙන් පැය ප්‍රවෘත්ති විකාශනයක් ලෙස ප්‍රතිඵල සාරාංශ ගත කර ප්‍රකාශ කිරීමට, මහජන අවශ්‍යතාවයක් ලෙස සලකා අවස්ථාව ලබා දිය හැකි ය.</u>

**04.** <u>සියළුම මුද්‍රිත මාධ්‍ය ආයතන (පුවත්පත්)</u>

මුද්‍රිත පුවත්පත් සඳහා ප්‍රතිඵල ලබා දීමට ගාස්තුවක් අය නොකරන අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේනතුව විසින් ඉටු කරනු ඇත. ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා සහතික කරන ලද ප්‍රතිඵල ලේඛනවල පරිලෝකනය කළ පිටපත් (Scanned Copy) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් අවශ්‍ය කටයුතු සිදු කර ඇත. එසේ වුවද පුවත්පත්වල වෙබ් අඩවි තුල සිදුකරන ප්‍රතිඵල විකාශන අයිතිය නිසි ලෙස ලබා නොමැති නම් එම වෙබ් අඩවි ඉහත 03 ඡේදයේ උපදෙස් පරිදි ක්‍රියාකළ යුතු වේ.

**05.** <u>විදේශීය මාධ්‍ය ආයතන</u>

විදේශ මාධ්‍ය ආයතන වල ශ්‍රී ලාංකික නියෝජිතයින් සඳහා ද සහතික කළ ප්‍රතිඵල ලබා දීමට අවශ්‍ය පහසුකම් ලබා දෙන ලෙස දන්වා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දී ඇත.

**06.** පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් මැතිවරණ ප්‍රතිඵල මාධ්‍ය වෙත ලබා දීමේ කාර්යය මැතිවරණ කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන්ගේ පාලනය යටතේ සිදු කෙරෙන අතර මේ සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් සයිබර් ආරක්ෂාව සඳහා ජාතික මධ්‍යස්ථානය (SLCERT), කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක විද්‍යායතනයේ (UCSC) සහ ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය (NSBM) යන ආයතන වල සේවයේ නියුතු තොරතුරු තාක්ෂණවේදී විශේෂඥයින්ගේ උපදෙස් සහ සහය මේ සඳහා ලබාගෙන ඇත.

<u>ඉතා වැදගත්</u>

**07.** මෙම මාධ්‍ය නිවේදනයේ සඳහන් පරිදි, විකාශන අයිතිය සඳහා ලියාපදිංචි වන විද්‍යුත් මාධ්‍ය ආයතනවලට වුවද ප්‍රතිඵල පරිගණක ජාල මඟින් ලබා දීමේ අවසන් තීරණය මැතිවරණ කොමිෂන් සභාව සතු වේ.

**08.** සෑම නිල ප්‍රතිඵලයක්ම නිසි ලෙස නිවැරදිව කඩිනමින් මහජනතාව වෙත ලබා දීම සඳහා පෙර සඳහන් කරණු වලට අනුකූලව ක්‍රියා කිරීම සියළුම මාධ්‍ය ආයතන වලින් අපේක්ෂා කරනු ලැබේ.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්